# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2446/28 – 2025 ජූලි මස 21 වැනි සඳුදා – 2025.07.21

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/25.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව

එස්. ආර්. ටී. පී. සිංහබාහු මයා, අංක ඩී 71/2, නාපේ, නෙලුන්දෙනිය.

සහ

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිවඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 04, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.


1A – G 044908 – 14 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2023/25.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. ආර්. ටී. පී. සිංහබාහු මයා, අංක ඩී 71/2, නාපේ, නෙලුන්දෙනිය.

සහ

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ, සිතියම් විද්‍යාඥ (Cartographer) වශයෙන් සේවය කරන එස්. ආර්. ටී. පී. සිංහබාහු මහතාට කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 යටතේ 2008.07.01 දින සිට තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ දී සමාන්තර ශ්‍රේණිවල නිලධාරීන්ට හිමිවී ඇති AR 1-2 වැටුප් කාණ්ඩය නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද, යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූනි මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 - 0245

---

මගේ අංකය: IR/COM/02/2024/02.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජී. එච්. එන්. ශ්‍යාමලී මිය, අංක 573/9, මහකටුවාන පාර, හෝමාගම

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිච්ඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 04, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2024/02.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජී. එච්. එන්. ශ්‍යාමලී මිය, අංක 573/9, මහකටුවාන පාර, හෝමාගම

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙහි, III ශ්‍රේණියේ ගණකාධිකාරීවරියක් වශයෙන් සේවයේ නියුතුව සිටි ජී. එච්. එන්. ශ්‍යාමලී මියට නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කිරීමේ දී පහත සඳහන් කරුණු මත යම් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද, යන්නත් පිළිබඳව වේ."

1. නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ තනතුර සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ දී කළමනාකරණ (මුදල්) II ශ්‍රේණියෙහි තනතුරක පිහිටුවා M M-1-1 හි II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ පිහිටුවීම

2. නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කිරීමේ දී පැමිණිලි පාර්ශ්වය හා සමාන මට්ටම්වල සිටි නිලධාරීන්ට වඩා පැමිණිලිකාරියට අසමානව සැලකීම".

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 07 – 0246

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.